# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2192/45 - 2020 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### කල්මුනේ මහ නගර සභාව

**කල්මුනේ මහ නගර සභා බල ප්‍රදේශ සීමාව තුළ ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කළමනාකාර සේවාව සැපයීම වෙනුවෙන් අයකරනු ලබන බදු ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධව දැන්වීම**

ඝණ අපද්‍රව්‍ය ඉවත්කිරීමේ සේවා බදු සම්බන්ධව 2019.03.08 වැනි දිනැති අංක 2113/61 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මහ ජනතාව වෙත කෙරෙන දැනුම් දීමයි.

| *අනු ක්‍රමික අංකය* | *ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සේවාව ලබන්නාගේ කාණ්ඩය* | *ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කළමනාකාර සේවා බදු (රු.)* |
|---|---|---|
| 01. | පදිංචි නිවස සඳහා හෝ ව්‍යාපාර ආයතනය (ඉහත සඳහන් වන ගැසට් නිවේදනයෙහි 04 වන කාණ්ඩය හැර) | සතියකට රු. 50.00 |
| 02. | කර්මාන්ත ශාලා සඳහා | දිනකට රු. 20.00 |
| 03. | ආපන ශාලාව, භෝජන ශාලා, කෙසෙල් ව්‍යාපාර ස්ථාන සහ හරක් මස්, එළු මස්, මාලු වර්ග හා කුකුල් මස් වැනි ව්‍යාපාර ස්ථාන සඳහා | කිලෝ ග්‍රෑම් 01 (1.Kg) රු. 05.00 |
| 04. | භාවිතාකළ කුරුම්බා ගෙඩි සහ තැඹිලි කුරුම්බා (භාග දෙකකට කපා වෙන්කර දිය යුතුය.) | එකක් සඳහා රු. 1.00 |

තවද, ඉහත දක්වා ඇති ඝණ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ බදු ගාස්තුව නොගෙවන්නේ නම්, එම ගාස්තුව අයකර ගැනීම සඳහා මහ නගර සභා ආඥා පනතේ අංක 247B (4), 267 යටතේ වන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සිදුවන බව සඳහන් ඡේදය මෙයට එකතු කර ඇති බවත් මෙයින් මහ ජනතාව වෙත දැනුම් දෙමි.

තව ද ඉහත සංශෝධනය 2020.10.01 වැනි දින සිට ක්‍රියාත්මක කරනු ලබන බවත් මෙයින් මහජනතාව වෙත දන්වා සිටිමි.

ඉහත සඳහන් වන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* 01 වන ඡේදයේ 01 වන පේලිය යටතේ 1989.01.28 යනුවෙන් වැරදි ලෙස සඳහන් වී ඇති වචන සටහන 1980.01.20 ලෙසත්, 02 වන පේලිය යටතේ 541/7 වශයෙන් වැරදි ලෙස සඳහන් වී ඇති කොටස 541/17 ලෙසත්, 04 වන පේලියේ 2002.07.06 වශයෙන් වැරදි ලෙස සටහන් වූ කොටස 2002.06.07 ලෙස ද, 08 වන පේලිය යටතේ 2013.07.26 යනුවෙන් වැරදි ලෙස සඳහන් වූ කොටස 2013.04.26 ලෙසත්, සංශෝධනය කරනු ලබන බවත් මෙයින් මහජනතාව වෙත දැනුම් දෙමි.

තව ද, ඉහත සංශෝධනය සහ එකතු කිරීම් ද උක්ත *අති විශෙෂ ගැසට් නිවේදනයට* ඒකාබද්ධ වූ කොටස් බවට සැලකිල්ලට ගත යුතු බවත් මෙයින් මහ ජනතාව වෙත දැනුම් දෙමි.

**නීතිඥ ඒ. ඇම්. රකීබ්,**
මහනගර පුරපති,
මහ නගර සභාව,
කල්මුනේ.

2020 සැප්තැම්බර් මස 08 වැනි දින,
මහා නගර සභා කාර්යාලය,
කල්මුනේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.